# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1980 අංක 48 දරන
# ශ්‍රී ලංකා ශ්‍රී නාරායන ගුරු සමිතිය
# පනත

---

**[සහතිකය සටහන් කළේ 1980 නොවැම්බර් මස 10 වන දින]**

**ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.**

---


1980 නොවැම්බර් මස 14 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැක.

**මිළ : ශත 45 යි** **තැපැල් ගාස්තුව : ශත 50 යි.**

**1980 අංක 48 දරන ශ්‍රී ලංකා ශ්‍රී නාරායන ගුරු සමිතිය පනත**

[සහතිකය සටහන් කළේ 1980 නොවැම්බර් මස 10 වන දින]

එල්.ඩී. —ඕ. 7/80

## ශ්‍රී ලංකා ශ්‍රී නාරායන ගුරු සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

පූර්විකාව.

" ශ්‍රී ලංකා ශ්‍රී නාරායන ගුරු සමිතිය " යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සමිතියක්, එකී සමිතියේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී සමිතියට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් කොළඹ පිහිටුවා තිබුණු හෙයින් ද :

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සමිතිය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ එම සමිතිය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

ලුහුඬු නාමය.

1. මේ පනත 1980 අංක 48 දරන ශ්‍රී ලංකා ශ්‍රී නාරායන ගුරු සමිතිය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ශ්‍රී ලංකා ශ්‍රී නාරායන ගුරු සමිතිය සංස්ථාගත කිරීම.

2. මේ පනත ආරම්භ වීමේ දින සිට හා ඉන් පසුව (මෙහි මින් මතු " සමිතිය " යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ශ්‍රී නාරායන ගුරු සමිතියේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හා සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින්මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන් " ශ්‍රී ලංකා ශ්‍රී නාරායන ගුරු සමිතිය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු " සංස්ථාව " යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් විය යුතු අතර පොදු මුද්‍රාවක් තබාගෙන පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඇතිව සංස්ථාව විසින් එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පැවරීම හා නඩු පවරනු ලැබීම කළ යුතු ද කළ හැකි ද විය යුතුය.

සංස්ථාවේ පොදු පරමාර්ථ

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ශ්‍රී නාරායන ගුරු උතුමාණන්ගේ ඉගැන්වීම, පරමාර්ථ හා දර්ශනය හා සම්බන්ධ ප්‍රකාශනයන් පිළිබඳව අධ්‍යයනය හා පර්යේෂණ වැඩි දියුණු කිරීම ;

(ආ) එතුමාගේ ඉගැන්වීම, පරමාර්ථ හා දර්ශනය ප්‍රගුණ කිරීම දිරිගැන්වීම ;

(ඇ) ශ්‍රී නාරායන ගුරු උතුමාණන්ගේ පරමාර්ථ, ඉගැන්වීම හා දර්ශනය මත පදනම් වූ ආයතන පිහිටුවීම, පැවැත්වීම සහ ඒවාට ආධාර කිරීම ;

ඒ — 45813 — 9,575 (79/11)

(ආ) විවිධ වාර්ගික හා ආගමික කණ්ඩායම් හා ජන සමූහයන් අතර සමගිය වැඩි දියුණු කිරීමටත් සමාජ අශක්නුතා ඉවත් කිරීමටත් ආධාර වීම ;

(ඉ) ලෝකයේ ජනතාව අතර සාමය සහ සමගිය ඇති කිරීමට ක්‍රියා කිරීමෙහිලා දේශීය හා විදේශීය සංවිධාන සමඟ සහයෝග යෙන් කටයුතු කිරීම ;

(ඊ) පහත දක්වෙන අරමුණුවලින් එකක් හෝ වැඩි ගණනක් සඳහා ස්වේච්ඡා පුණ්‍ය සංවිධාන පිහිටුවීම සහ පවත්වාගෙන යාම :—

(i) දුප්පත්කම හා නූගත්කම දුරලීමට ආධාර වීම ;

(ii) නිවාස, අනාථ නිවාස, හා බෙහෙත් ශාලා පිහිටුවීම මගින් අනාථයන්, වෘද්ධයන් හා දිළිඳු තැනැත්තන් රැකබලා ගැනීම ;

(iii) අසරණයන්, අනාථයන්, දිළිඳු තැනැත්තන් හා රෝගීන් සඳහා කෑම බීම, පෝෂණ ශක්තිය හා වෛද්‍ය ආධාර ලබා දීමෙන් කුසගින්න, රෝගාබාධ හා ලෙඩ දුක් සම්බන්ධයෙන් සහනය සැලසීම ;

(iv) ශ්‍රී ලංකාවේ හෝ විදේශයක කවර හෝ අධ්‍යයන ආයතනයක ශ්‍රී නාරායන ගුරු උතුමාණන්ගේ ඉගැන්වීම, පරමාර්ථ හා දර්ශනය පිළිබඳ උසස් අධ්‍යයන කටයුතු හෝ පර්යේෂණ පැවැත්වීම සඳහා කුලය, ආගම, වර්ණය හෝ වර්ගය නොසලකා කවර හෝ පුද්ගලයෙකුට මුදල් ආධාර දීම සඳහා ශිෂ්‍යත්ව අරමුදලක් පිහිටුවීම ;

(v) ශ්‍රී නාරායන ගුරු උතුමාණන්ගේ ඉගැන්වීම, පර මාර්ථ හා දර්ශනය පිළිබඳ විවිධ අංශ සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීම හා පර්යේෂණ පැවැත්වීම සඳහා මධ්‍යස්ථානයක් ශ්‍රී ලංකාවෙහි පිහිටුවීම හා ඊට සම්බන්ධ සියලු දේවල් කිරීම ; සහ

(vi) සාමාන්‍යයෙන් ඉහත කී අරමුණු ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය සියලු කටයුතු කිරීම ;

(උ) කොළඹ 14, ලෙයාඩ්ස් බ්‍රෝඩ්වේ අංක 133 දරන ස්ථානයේ ශ්‍රී නාරායන ගුරු ගුණානුස්මරණ මලයාලි ශාලාව නඩත්තු කිරීම, අලුත්වැඩියා හා ප්‍රතිසංස්කරණය කිරීම ; සහ

(ඌ) දේශන, පන්ති, පුස්තකාල හා සම්මන්ත්‍රණ පැවැත්වීම හා සංස්කෘතික හා වෙනත් වැඩදයක ක්‍රියාකාරකම් මගින් ජනතා වට දැනීම හා අධ්‍යාපනය ලබාදීම.

ක්‍රියාකාරී කමිටුවක සහාය ඇත් භාරකාර මණ්ඩලය.

4. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ තත් කාලයෙහි බල පවත්නා රීතිවලට අනුකූලව තෝරා පත්කරගනු ලබන තැනැත්තන් සංඛ්‍යාව කින් සමන්විත ක්‍රියාකාරී කමිටුවක සහාය ඇතිව භාරකාර මණ්ඩලයක් විසින් සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව පරිපාලනය කරනු ලැබිය යුතුය.

(2) මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ ධුර දරන සමිතියේ භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය විය යුතුය.

(3) මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ ධුර දරන සමිතියේ ක්‍රියාකාරී කමිටුවේ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම ක්‍රියාකාරී කමිටුව විය යුතුය.

සංස්ථාවේ රීති.

5. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද, භාරකාර මණ්ඩලයේ, ක්‍රියාකාරී කමිටුවේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ හා සේවකයන්ගේ කාර්ය ඉටු කිරීම සම්බන්ධයෙන් ද සංස්ථාවේ කටයුතු කරගෙන යාමේ කාර්ය පරිපාටිය සම්බන්ධයෙන් ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා ද එහි පරමාර්ථ මුදුන් පත් කර ගැනීම සඳහා ද සංස්ථාව විසින්, කලින් කල, සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමක දී පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) තත් කාලයෙහි බලපවත්නා සංස්ථාවේ කිසිම රීතියක් හෝ මින් මතු සම්මත කරගනු ලබන කිසිම රීතියක් වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් හැර, කරනු නොලැබිය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ බලපවත්නා සමිතියේ රීති මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලු සාමාජිකයන් සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සමිතිය විසින් ගෙවිය යුතු ණය හා සමිතියට ගෙවනු ලැබිය යුතු ණය.

6. මේ පනතේ කාර්ය සඳහා මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ පවත්නා සමිතියේ සියලු ණය හා වගකීම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවනු ලැබිය යුතු අතර සමිතියට අය විය යුතු සියලු ණය හා සමිතියට ගෙවනු ලැබිය යුතු සියලු දායක මුදල් හා සාමාජික මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

7. යථා පරිදි බලය පවරනු ලැබූ භාරකාර මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර එකී සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට අතිරේකව විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව

8. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් සංස්ථාව වෙත සතු කරනු ලැබිය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීමට හෝ දැරීමට නීතිය අනුව සංස්ථාවට හැකියාව තිබිය යුතු අතර එම දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව මේ පනතේ කාර්ය සඳහා සහ සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව එකී සියලු දේපළ සංස්ථාව විසින් දැරිය යුතු ය.

ණය ගැනීමේ බලකල.

**9.** ස්වකීය පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා සංස්ථාව විසින් මුදල් ලබා ගැනීම සහ එම කාර්යය සඳහා යම් උකස්, බැඳුම්කර හෝ බැඳීම් සංස්ථාව විසින් ඇති කිරීම, ක්‍රියාවෙහි යෙදීම, හෝ දූරීම නීත්‍යනුකූල විය යුතු ය :

එසේ වුව ද සංස්ථාව විසින් එසේ ලබා ගත හැකි මුදල්වල එකතුව භාරකාර මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන මුදල නොඉක්ම විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**10.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම් වලට හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තා. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති

**නොසැපයීමේ කොන්දේසිය මත පමණද දායක මුදල් භාරගනු ලැබේ.**